.

## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## අනධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල **ස්ථිර සේවයේ නියුතු සේවක භවතුන්** ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරගත් අයදුම්පත්, තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/ මණ්ඩපාධිපති මගින් 2019.09.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී, ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය** යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපහැදිලි හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

1996.10.18 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව අදාළ පරිදි ලිඛිත, යෝග්‍යතා හෝ ප්‍රායෝගික පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාව පදනම් කරගෙන සුදුස්සන් තෝරාගනු ලැබේ.

### 01. පරිපාලක (නඩත්තු) 111 ශ්‍රේණිය

**සුදුසුකම් (**

**1.** (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සහිතව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ සමත් වීම

හෝ

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයයන් සහිතව විෂයයන් 06 කින් තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ සමත් හා උසස් අධ්‍යාපන ආයතනයක වසර අටක (08ක) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

(ඇ) හත්වන ශ්‍රේණිය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ වසර පහළොවක (15) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**11.** කම්කරු පාලනය පිළිබඳ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම

**වැටුප් ක්‍රමය – U-MN 1(III) re. 27794 -17x271 -32401** (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2019 වර්ෂයට අදාල වැටුප් පරිමාණය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### 02. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I). (අ). ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ සමාන සුදුසුකම් සමඟ වර්ෂ තුනක පළපුරුද්ද (ජාතික තාක්ෂණ පිළිබඳව සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

**හෝ**

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම හා රාජ්‍ය /පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂකවරයෙකු ලෙස වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් ක්‍රමය : UMT1 (III) රු. 28,607 -7x 271;10x321-33714 (මාසික)**

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2019 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය) මෙයට අමතර රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

### 03. තාක්ෂණ නිලධාරි (ICT) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I) අ.පො.ස (උ/පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) එකම වතාවකදී විද්‍යා විෂය ධාරාවේ විද්‍යා විෂයයන්ගෙන් සමත් වීම, විෂය සංකලනය දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි අදාළ පීඨය මගින් තීරණය කරනු ලැබේ.

**සහ**

(II) තොරතුරු සන්නිවේදනය සහ බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ /වෘත්තීය අභ්‍යාස ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් නිකුත් කරනු ලබන, ජාතික වෘත්තීය කුසලතා NVQ 5 මට්ටම හෝ නොඅඩු මට්ටමක නිපුණතා සහතිකයක් ලබා තිබීම.

ICT (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සහිත අයහට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය : UMT1 (III) – රු.28607-7x271;10x321-33714 (මාසික)**

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2019 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 04. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I) අ.පො.ස (සා/පෙළ) විභාගයේ

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක වරක දී සමත්ව තිබීම.

සහ

(II) අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

ගබඩාකරණය පිළිබඳ එක් අවුරුදු පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ වාණිජ්‍යය විෂය සමත්වීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණ විෂය සමත් වීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

සහ

(ආ). පරිගණක යෙදුම් පැකේජ් භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වැටුප් ක්‍රමය : UMN 1 (III A) – 27794 - 17×271 - 32401 (මාසික)**

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2019 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සටහන** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුයි.

### 05. නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි

**සුදුසුකම් :**

(I) ආරක්ෂක පරීක්ෂක I ශ්‍රේණිය හෝ ඉන් ඉහළ තනතුරක සේවයේ නියුතුව ආරක්ෂක සේවා

පරීක්ෂකවරයෙකු වශයෙන් වසර 16 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය : UMN 4 (II) – 38,717 - 20×586; 1×615 - 51052 (මාසික)**

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2019 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### 06. රියදුරු (II ශ්‍රේණිය )

**සුදුසුකම් :**

I. හත්වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

II. ලොරි හා බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතුය.

III. රියදුරෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. ධාවන අළුත්වැඩියාවන් කර ගැනීමේ හැකියාව තිබිය යුතුය.

IV. උස අවම වශයෙන් අඩි 05 අඟල් 2 $^1/_2$ ක් විය යුතුයි.

V. මහාමාර්ග උපදේශක සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් ලබා තිබිය යුතුය.

VII, දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේ ද සේවය කිරීම සඳහා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත වීම සහ ඇස් පෙනීම හොඳ තත්වයෙන් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය : UPL3 (III) රු. 27,062 -16x244 – 30,966 (මාසික)**

ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**තෝරා ගැනීම** : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ඩබ්ලිව්.එම්.කරුණාරත්න**
**ලේඛකාධිකාරී**
2019.08.26

Source: www.kln.ac.lk (2019.09.02)